SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර I විභාගය - 2022 ජූලි

# යෝජිත උත්තර

# (104) ව්‍යාපාරික පරිසරය (BEN)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජුලි

## (104) ව්‍යාපාරික පරිසරය

# යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 20 කි
(මුළු ලකුණු 40)

**A කොටස**

*පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

**1.1** (2)

**1.2** (4)

**1.3** (4)

**1.4** (3)

**1.5** (1)

**1.6** (4)

**1.7** (1)

**1.8** (2)

**1.9** (3)

**1.10** (3)

**1.11** අසත්‍යයි

**1.12** සත්‍යයි

**1.13** සත්‍යයි

**1.14** සත්‍යයි

**1.15** අසත්‍යයි

***(එකකට ලකුණු දෙක 02 බැගින් මුළු ලකුණු 30)***

**1.16.**

| ලක්ෂණ | මුදල් වෙළඳපොළ | ප්‍රාග්ධන වෙළෙඳපොළ |
|---|---|---|
| **අරමුදල් වල කාලසීමාව** | වසරකට වඩා අඩු කාලසීමාවක් ඇති ණය මුදල් පිළිබඳව කටයුතු කරයි. | වසරකට වඩා වැඩි කාල සීමාවක් ඇති දිගුකාලීන අරමුදල් පිළිබඳව කටයුතු කරයි |
| **මුදල් සැපයුම** | සමාගම්වල ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලට අදාළ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා මුල්‍යයනය කිරීම වෙනුවෙන් අරමුදල් සැපයීම | වෙළෙඳ හා වාණිජ කටයුතුවලට අදාළ ස්ථාවර ප්‍රාග්ධන හා රජයේ දිගුකාලීන අවශ්‍යතා මුල්‍යයනය කිරීම පිළිබඳව කටයුතු කරයි |
| **භාවිත වන සුරැකුම්පත්** | වාණිජ බිල්පත් (විනිමය බිල්පත්, භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා ආදිය) වැනි උපකරණ මෙහිදී ගනුදෙනු වේ | කොටස්, ණයකර, රජයේ බැඳුම්කර වැනි උපකරණ යනාදිය ගනුදෙනු කරයි. |
| **ප්‍රධාන ආයතනවල කාර්යභාරය** | මුදල් වෙළෙඳපොළ සම්බන්ධ ප්‍රධාන ආයතන වනුයේ මහ බැංකුව හා වාණිජ බැංකු ය | සංවර්ධන බැංකු හා රක්ෂණ සමාගම් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ප්‍රමුඛ කාර්යභාර්යක් ඉටු කරයි |
| **සුරකුම්පත්වල සුලභතාවය** | මුදල් වෙළෙඳපොළ තුළ හුවමාරුවන සුරැකුම්පත්වලට අදාළව සාමාන්‍යයෙන් ද්විතියික වෙළෙඳපොළක් නොමැත | ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ පවතින සුරැකුම්පත් වෙනුවෙන් ද්විතියික වෙළෙඳපොළක් පවතී |
| **ඛණ්ඩනය කිරීම** | මුදල් වෙළෙඳපොළ තුළ ඛණ්ඩනය කිරීමක් නොමැත | ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතියික වෙළෙඳපොළ ලෙස ඛණ්ඩනය කිරීමක් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ පවති |
| **ගනුදෙනු සිදුවන ස්ථානය** | බොහෝ විට දුරකථනය හරහා ගනුදෙනු සිදුවන අතර ගනුදෙනු සිදුකිරීම සඳහා විධිමත් ස්ථානයක් නොමැත | ගනුදෙනු විධිමත් ස්ථානයක සිදුවේ<br>උදා- කොටස් හුවමාරුව |

***(ලකුණු 02)***

SRI LANKA

**1.17.**

1. එකම භාෂා මාධ්‍යය භාවිත කිරීම
2. පහසුවෙන් මැකී නොයන තීන්ත වර්ගයක් භාවිත කිරීම
3. ලිවීමේදී සිදු වන වැරදි තනි ඉරකින් කපා අයිතිකරුගේ සම්පූර්ණ අත්සන යෙදීම
4. අණකරුගේ අත්සන නියම ආකාරයෙන් භාවිත කිරීම
5. චෙක්පතට යොදන දිනය හා ආරක්ෂාව පිළිබඳ සැලකීම
6. පිළිපතෙහි අදාළ විස්තර සටහන් කර ගැනීම
7. හිස් චෙක්පත් අත්සන් යෙදීමෙන් වැළකීම
8. මුදල් චෙක්පත් ඕනෑම අයෙකුට මාරු කරගත හැකි නිසා ඒවා ලිවීම හැකිතාක් දුරට අඩු කිරීම හා ඒවා ලියන්නේ නම් රේඛනය කිරීම.
9. චෙක්පතෙහි ආදායකයාගේ නම නිවැරදිව සටහන් කිරීම

***(ලකුණු 02)***

**1.18.**

විධිමත් සංවිධානයක් යනු නිශ්චිතව නිර්වචනය කරන ලද ව්‍යුහයකට අනුව පුද්ගලයින් අතර නිර්මාණය වන්නාවූ පුද්ගල කණ්ඩායම් වේ.
උදා AAT ශ්‍රී ලංකා, ශ්‍රී ලංකා මහ බැංකුව

අවිධිමත් සංවිධානය යනු විධිමත් ව්‍යුහයකින් තොරව පුද්ගලයන්ගේ එදිනෙදා සාමාජීය ක්‍රියාකාරිත්වය හි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන්නා වූ සංවිධාන වේ.
උදා - මිතුරන් කණ්ඩායමක්, Facebook ප්‍රජා සමූහය, WhatsApp සමූහය

*(ලකුණු 02)*

**1.19.**

1. නව රැකියා අවස්ථා ජනිත කිරීම
2. නව ආදායම් සහ සේවා පරිභෝජනයට අවස්ථා උදා කිරීම
3. නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදා කිරීම
4. ප්‍රාදේශිය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම
5. නව වෙළෙඳපොළවල් සංවර්ධනය
6. ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම
7. ආර්ථික වෘද්ධියක් ඇති කිරීම
8. ජාතික නිෂ්පාදිතය ඉහළ යාම
9. තිරසාර ආර්ථික සංවර්ධනයට මග පෑදීම
10. නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය වීම
11. සාධාරණ තරගකාරිත්වයක් නිර්මාණය වීම
12. දිළිදුබව අඩු කිරීම

*(ලකුණු 02)*

**1.20.**

1. කාන්තාවන් තුළ අධ්‍යාපන මට්ටම දියුණු වීම
2. ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය ඉහළ යාම
3. සමාජීය ආකල්පවල ඇති වෙනස්කම් (කාන්තාවන් වෘත්තියක නියැලීම හා ව්‍යාපාර කටයුතුවලට දායක විය යුතු පාර්ශ්වයන් ලෙස සැලකීම)
4. කාන්තාවන්ගේ දායකත්වය අවශ්‍ය වන ව්‍යාපාර ක්ෂේත්‍රවල ඇති වූ වර්ධනය
5. පවුලේ ආදායම වැඩි කර ගැනීමේ අවශ්‍යතාවය පැන නැගීම
6. දැඩි අරපිරිමැස්මෙන් කටයුතු කිරීමට සිදු වීම

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 40)*

***A කොටසෙහි අවසානය***

**(මුළු ලකුණු 40 යි)** | **B කොටස**

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:

***පරිච්ඡේදය 01 (II) - ව්‍යාපාර සංවිධාන***

**(a)** හවුල් ව්‍යාපාර

*(ලකුණු 02)*

**(b)** **හවුල් ව්‍යාපාර ක්‍රමයේ මූලික ලක්ෂණ**

| | |
|---|---|
| **අයිතිය** | අවමය 02 යි. උපරිමය 20යි. නමුත් වෘත්තීමය හවුල් ව්‍යාපාර සඳහා උපරිමයක් නොමැත. |
| **ප්‍රාග්ධනයට දායකවීම** | හවුල්කරුවන් විසින් එකඟ වූ අගය මත ප්‍රාග්ධනය සඳහා දායක වෙනු ලැබේ. |
| **අසීමිත වගකීම** | හවුල්කරුවන්ගේ වගකීම අසීමිතය. |
| **කළමනාකරණය** | සියලු ම හවුල්කරුවන් විසින් හෝ හවුල්කරුවන් කීපදෙනෙකු විසින් කළමනාකරණය කරනු ලැබේ. |
| **ලාභය බෙදාගැනීම** | එකඟ වූ පරිදි ලාභය බෙදා ගනු ලැබේ. |
| **පාලනය** | හවුල්කරුවන්ගේ සාමූහික පාලනය සහ හවුල් ගිවිසුම හා හවුල් ආඥා පනතට අනුව පාලනය සිදුවේ. |
| **පැවැත්ම** | අඛණ්ඩ පැවැත්මක් නොමැත. |
| **නෛතික පුද්ගලභාවය** | නෛතික පුද්ගලභාවයක් නොමැති අතර නීතිය ඉදිරියේ හවුල්කරුවන්ගේ නමින් පෙනී සිටිය යුතු වේ. |
| **ලියාපදිංචිය** | සියලු ම හවුල්කරුවන්ගේ නම්වලින් ලියාපදිංචිය පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි කිරීම අනිවාර්යය නොවේ. |
| **ගිණුම් තැබීම හා විගණනය** | ගිණුම් තැබීම හා විගණනය අනිවාර්යය නොවේ. |
| **විසුරුවා හැරීම** | අධිකරණය විසින් විසුරුවා හැරීම හෝ ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීම. |
| **බදු ගෙවීම** | ව්‍යාපාරය නමින් ආදායම් බදු ගෙවිය නොහැකි අතර හවුල්කරුවන් ඔවුන්ගේ ආදායම් බදු තනි තනිව ගෙවිය යුතුවේ. |

*(ලකුණු 06)*

**(c) හවුල්කාරිත්වයේ අවාසි**

1. අසීමිත වගකීම
2. අඛණ්ඩ පැවැත්මක් නොමැතිකම
3. විශාල අරමුදල් සංචිතයක් ආකර්ෂණය කර ගැනීමේ අපහසුතාව
4. තීරණ ගැනීමේ අපහසුතාව

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 10)***

at SRI LANKA

### තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| පරිච්ඡේදය 03 - ව්‍යාපාර උපකාරක සේවා |
|---|

**(a)**

**1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**

- භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුෂ්කරතා ඉවත් වීම
- හුවමාරුව පහසු වීම සහ කාර්යක්ෂම වීම
- විශේෂීකරණයට සහ ශ්‍රම විභජනයට මග පෑදීම
- ආර්ථිකය තුළ නිෂ්පාදන කටයුතු ප්‍රසාරණය වීම

**2. වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස ක්‍රියාත්මක වීම**

- ආර්ථික ගණුදෙනු ගිණුම්ගත කිරීමට හැකි වීම
- භාණ්ඩ හා සේවාවල වටිනාකම සැසඳිය හැකි වීම
- ආර්ථිකයේ ගනුදෙනු පහසු වීම
- ආර්ථිකයේ සම්පත් කාර්යක්ෂමව බෙදීමට හැකි වීම

**3. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**

- අනාගතයේ කෙරෙන ගෙවීම් මැනිය හැකි වීම
- පොලිය සහිත ව ණය බේරුම් කිරීම
- අනාගත ගෙවීම් පිළිබඳ වාර්තා තබා ගැනීමේ පහසුව
- ව්‍යාපාර කටයුතු හා පාරිභෝගික ජීවන තත්ත්වය වර්ධනය වීම
- ණය පදනම මත භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ පහසුව ඇති වීම

**5. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම**

- පූර්ණ ද්‍රවශීලතාවක් පැවතීම
- මුදල් ශේෂ ළග තබා ගැනීමේ පහසුව
- නශ්‍ය නොවන හෙවත් යල් නොපැනීම
- මූල්‍ය නොවන වත්කම්වල වෙළෙඳපොල මිල අවිනිශ්චිතතා වැඩි වුවද, මුදල්වල එම තත්ත්වය අවම වීම.

*(ලකුණු 04)*

**(b) ජංගම ගිණුම් හිමියෙකුට ඇති ප්‍රතිලාභ**

1) චෙක්පත් මගින් සිය ගෙවීම් කළ හැකි වීම
2) නිත්‍ය නියෝග ගෙවීමට බැංකුවට උපදෙස් දීමට හැකි වීම
3) නිත්‍ය නියෝග ලබා ගැනීමට හැකි වීම
4) බැංකු අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
5) තත්ත්ව වාර්තා ලබා ගැනීමට හැකි වීම
6) ආරක්ෂා සහිත වීම
7) ගෙවූ බවට ඔප්පු කිරීමට පහසු වීම
8) බැංකු ණය ලබා ගැනීමේදී වැදගත් වීම

*(ලකුණු 03)*

aat SRI LANKA

**(c)**

මතුදාතම යෙදු චෙක්පතක ලියා පවරන දිනයට අනාගත දිනයක් චෙක්පතෙහි දිනය ලෙස නම් කිරීමයි. මෙය නිශ්චිත දිනයකට මත්තෙන් ගෙවීම සඳහා චෙක්පත ඉදිරිපත් කිරීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයක් ලෙස මෙය දැක්විය හැකිය. විවෘත චෙක්පතක් යනු රේඛනය නොකළ චෙක්පතකි. ආදායකයාට අදාළ බැංකු කවුන්ටරයෙන් කෙලින් ම මුදල් කරගත හැකිය.

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරය:*

***පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම***
***පරිච්ඡේදය 06 - ආර්ථික කොඳුනාරටිය ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර***

**(a)**

1. වැඩි ලාභ අවස්ථා නිර්මාණය කිරීම
2. අමුද්‍රව්‍ය සහ සේවාවලට ප්‍රවේශ වීම
3. තරගකාරීත්වයේ වාසි
4. බදු ප්‍රතිලාභ
5. ගෝලීය වෙළෙඳපොළ තුළට ප්‍රවේශ වීම
6. දේශීය වෙළෙඳපොළ මත යැපීම අඩු වීම
7. විවිධාංගීකරණය සඳහා අවස්ථාව සැලසීම
8. ව්‍යාපාරය සඳහා වර්ධන මාර්ග / අවස්ථා වැඩි කිරීම

***(ලකුණු 03)***

**(b)**

**1. උපදෙස් සහ පුහුණුව ලබා දීම**

රජයේ විවිධ දෙපාර්තමේන්තු හා වෙනත් රාජ්‍ය ආයතන මගින් නිෂ්පාදන, තාක්ෂණය, ගුණත්ව පාලනය, ව්‍යාපාර සැලසුම්කරණය, අලෙවිකරණය සහ ව්‍යාපාර මූල්‍යනය වැනි විවිධ ක්ෂේත්‍රවල සඳහා මාර්ගෝපදේශ සැපයීම. ඒවා;

- කාර්මික සංවර්ධන මණ්ඩලය
- කාර්මික තාක්ෂණ ආයතනය
- ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
- අපනයන සංවර්ධන මණ්ඩලය
- ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය

**2. තොරතුරු සැපයීම**

රජය ව්‍යාපාරවලට අවශ්‍ය වන තොරතුරු විශාල ප්‍රමාණයක් ලබා දීම සඳහා ක්‍රම සහ පද්ධති මාලාවක් හඳුන්වා දී ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි ආයතන විවිධ තොරතුරු ලබයි. අපනයනයට අදාළ තොරතුරු අපනයන සංවර්ධන මණ්ඩලය සහ වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ.

**3. විනිමය පහසුකම් සැපයීම**

ව්‍යාපාරික කටයුතු සඳහා විදේශිය මුදල් මිලදී ගැනීමේදී විශේෂ පහසුකම් සැපයීම, විනිමය ගනුදෙනු හුවමාරු කිරීමට ඇති බාධා අවම කිරීම සහ විදේශ විනිමයෙන් ගිණුම් විවෘත කිරීමට අවසර දීම මෙහිදි දැක්විය හැකිය.

**4. මූල්‍ය ආධාර සැපයීම**

ස්ථාවර ප්‍රාග්ධනය සහ කාරක ප්‍රාග්ධනය සඳහා විවිධ ආයෝජන අවශ්‍යතා සඳහා රජය මූල්‍ය පහසුකම් සපයයි. රාජ්‍ය බැංකු හරහා ව්‍යාපාරවලට ණය ලබා දීම  කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) සඳහා තීරණාත්මක වන අතර, ඒ සඳහා ණය සීමාවන් විශාල සමාගම්වලට වඩා බැඳී පවතී.

**5. බදු සහන ලබා දීම**

කුඩා හා විශාල සමාගම් සඳහා බදු සහන සාමාන්‍යයෙන් අරමුණු කරන්නේ ප්‍රජාවට හෝ ඔවුන් ක්‍රියාත්මක වන කලාපයට ප්‍රතිලාභ ලබා දෙන ඉලක්ක සපුරා ගැනීමයි.

*(ලකුණු 04)*

**(c)**

**1) රැකියා අවස්ථා ලබා දීම**

ගිගර් සමාගම රට තුළ විවිධ රැකියා අවස්ථා සපයයි. මෙම තත්ත්වය රජයට තම අරමුණු ඉටුකර ගැනීමට ඉඩ සලසයි. විශේෂයෙන්ම, එය රැකියා ස්ථාවරත්වය, ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සහ ආදායම් ධනය නැවත ආයෝජනය සඳහා හිතකර පරිසරයක් මෙමගින් නිර්මාණය වනු ඇත.

**2) පරිසරයට වන හානිය අවම කිරීම**

පරිසරය වර්තමානයේ විකාශනය වෙමින් පවතින තිරසාර සංවර්ධන ක්ෂේත්‍රයක් ලෙස සැලකිය හැකිය. ව්‍යාපාර පරිසර හිතකාමී ප්‍රවේශයක් කරා ගමන් කරන අතර සෑම ව්‍යාපාරික තීරණයක් සහ ක්‍රියාවකදීම පාරිසරික හානිය අවම කරයි.

**3) දේශීය සම්පත් භාවිතය**

ව්‍යාපාරික අරමුණු සඳහා රටේ සම්පත් වැඩි කිරීම සහ දේශීය සම්පත් භාවිත කිරීම මිනිසුන්ගේ මිලදී ගැනීමේ හැකියාව වැඩි කරයි. එබැවින් රටේ ආර්ථික සංවර්ධනය, ආර්ථික වර්ධනය සහ පූර්ණ සේවා නියුක්තිය සඳහා වන දායකත්වය ඉහළ ය.

**4) නිසි පරිදි බදු ගෙවීම**

ගිගර් සමාගම රජයේ බදු පැහැර හැරීමකින් තොරව, ඔවුන්ගේ ආදායම හෝ ලාභය මත පදනම්ව බදු ගෙවිය හැකිය. එමගින් රජයේ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය මුදල් ලබා දීම සිදු වේ.

**5) රජයේ ප්‍රතිපත්ති අනුගමනය කිරීම**

රජය වරින් වර ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ව්‍යාපාර බැඳී සිටී. එය ගිගර් සමාගම සඳහා ද අදාළ වේ. එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය සහ ආර්ථිකය තුළ අදාළ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසායකයින් විශාල දායකත්වයක් සපයයි.

**6) නීතිරීතිවලට බැඳීම සහ පිළිපැදීම**

ව්‍යාපාර සඳහා රජය විසින් කලින් කලට පනවා ඇති නීතිරීතිවලට අනුකූල විය යුතුය. එය යහපත් ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීමට ව්‍යාපාරවලට උපකාරී වේ.

**7) විදේශ සංචිත වැඩි වීම**

සමාගම අපනයන සමාගමක් වන අතර එය රටට විදේශ සංචිත වැඩි කිරීමට අවස්ථාව උදා කරයි.

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10)*

*පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| |
|---|
| ***පරිච්ඡේදය 03 - ව්‍යාපාර උපකාරක සේවා*** <br> ***පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම*** |

**(a)**

1) අවශ්‍ය භෞතික හා මානව සම්පත් කාලෝචිත ලෙස සම්පාදනය කිරීමට හැකි වීම
2) නිමි භාණ්ඩ නියමිත වේලාවට වෙළෙඳපොලට ලබා දීම
3) අවශ්‍යතාවයට අනුව නියමිත වේලාවට භාණ්ඩ හා ද්‍රව්‍ය ලබා ගැනීම
4) පාරිභෝගිකයා වෙත නිෂ්පාදන අඛණ්ඩව බෙදාහැරීමට
5) වෙළෙඳපොල පුළුල් කිරීමට
6) පාරිභෝගිකයින්ට නිමි භාණ්ඩ නියමිත වේලාවට බෙදාහැරීමට
7) ප්‍රමාදයකින් තොරව නියමිත වේලාවට ඇණවුම් ලැබීම නිසා පාරිභෝගික තෘප්තිමත් වීම

*(ලකුණු 03)*

**(b)**

| ප්‍රවාහන පද්ධතියේ මූලිකාංග | උදාහරණ |
|---|---|
| මාර්ගය | අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, ජල මාර්ග, ගුවන් මාර්ග, නල මාර්ග |
| මාධ්‍යය | බස් රථ, දුම්රිය, නැව්/යාත්‍රා, ගුවන් යානා, කරත්ත, මෝටර් රථ, බයිසිකල්, ලොරි |
| බලය | ඉන්ධන බලය, විදුලි බලය, ගෑස් බලය, මිනිස් බලය, සත්ව බලය, සුළං බලය, සූර්ය බලය, ගල් අඟුරු බලය |
| පර්යන්තය | බස් නැවතුම්පල, දුම්රිය ස්ථාන, ගුවන් තොටුපල, වරාය |

*(ලකුණු 03)*

SRI LANKA

**(c) විද්‍යුත් වෙළෙඳාම ජනප්‍රියතාවයට හේතු**

1. දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කිරීමේ හැකියාව
2. ආරම්භක පිරිවැය අඩු වීම
3. වෙළෙඳපොළ පුළුල් වීම
4. අතරමැදියන් අවම වීම නිසා මිල මට්ටම අඩු වීම
5. නව අයිතම භාවිත කිරීමට අවස්ථාව සැලසීම
6. නිෂ්පාදන තෝරාගැනීමේ අවස්ථාව පුළුල් වීම
7. ලේඛන භාවිතය අවම වීම
8. ව්‍යාපාර කටයුතු වේගවත් වීම
9. මිනිසුන් අතර භාවිතයේ පහසුව වීම
10. ගනුදෙනුකරුවන්ගේ කාලය සහ ශ්‍රමය ඉතිරි වීම

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

| |
|---|
| ***B කොටසෙහි අවසානය*** |

(මුළු ලකුණු 20 යි)

**C කොටස**

### *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**(a)**

**අභ්‍යන්තර පරිසරය** යනු ව්‍යාපාරයක් තුළ ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන සාධක එකතුවකි. මෙම සාධක ව්‍යාපාරික පරිසරයේ විෂය පථය තුළ කළමනාකරුවන්ට පාලනය කළ හැකිය. අභ්‍යන්තර පරිසරයේ හෝ අභ්‍යන්තර පාරිසරික විචල්‍යවල සාධක පහත පරිදි වේ;

1) සංවිධානයේ වටිනාකම් පද්ධතිය
2) සංවිධාන සංස්කෘතිය
3) මෙහෙවර ප්‍රකාශය
4) කළමනාකරණ / ආයතනික ව්‍යුහය
5) මානව සම්පත්

රිච් කුකීස් හි අභ්‍යන්තර පරිසර සාධක සඳහා උදාහරණ පහත පරිදි වේ;

- *ආයතනික සංස්කෘතියඃ* රිච් කුකීස් යනු සීමිත සේවක සංඛ්‍යාවක් සිටින පවුලේ ව්‍යාපාරයක් බැවින්, ආයතනය තුළ 'බල සංස්කෘතිය' පවතින බව ප්‍රකාශ කළ හැක.
- *ආයතනික ව්‍යුහයඃ* පැතලි ආයතනික ව්‍යුහය, ව්‍යාපාර කළමනාකරණය කරනු ලබන්නේ දක්ෂ සේවකයින් කිහිප දෙනෙකු සමඟ ආරම්භකයින් විසිනි
- *මානව සම්පත්:* ව්‍යාපාරයේ දක්ෂ සහ පක්ෂපාතී සීමිත සේවක සංඛ්‍යාවක් සේවය කරයි

ව්‍යාපාරයක **බාහිර පරිසරය** යනු කළමනාකරුවන්ට පාලනය කළ නොහැකි සහ ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි වක්‍රව බලපෑම් කරන සාධක සහ බලවේගයන්ගේ එකතුවකි. බාහිර පරිසරය සමන්විත වන්නේ;

- ආසන්න පරිසරය - (පාරිභෝගිකයින්, සැපයුම්කරුවන්, තරගකරුවන්, අතරමැදියන්, බලපෑම් කරන කණ්ඩායම්) සහ
- සාර්ව පරිසරය - (දේශපාලන සහ නෛතික පරිසරය, ආර්ථික පරිසරය, සමාජ සහ සංස්කෘතික පරිසරය, තාක්ෂණික පරිසරය, ස්වභාවික පරිසරය, ප්‍රජා පරිසරය, ගෝලීය පරිසරය)

රිච් කුකීස් හි බාහිර පාරිසරික සාධක සඳහා උදාහරණ පහත පරිදි වේ;

- *සැපයුම්කරුවන්* : බොහෝ ද්‍රව්‍ය සපයනු ලබන්නේ විදේශීය සැපයුම්කරුවන් වේ
- *පාරිභෝගිකයන්* : රිච් කුකීස් සන්නාමයේ පාරිභෝගිකයින්
- *දේශපාලන සහ නෛතික පරිසරය* : දේශපාලන අස්ථාවරත්වය, සිවිල් යුද්ධය, රජයේ ප්‍රතිපත්තිවල වෙනස්කම්
- *ආර්ථික පරිසරය* : ආර්ථික පරිසරයේ වෙනස්වීම් (විනිමය අස්ථාවරත්වයෙන් ඇති වන ප්‍රතිවිපාක)
- *සමාජීය සහ සංස්කෘතික පරිසරය* : බිස්කට් පරිභෝජනය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ ආකල්ප සහ රුචියේ ඇති වූ වෙනස්වීම්
- *ස්වභාවික පරිසරය* : ස්වභාවික විපත්
- *ගෝලීය පරිසරය* : ගෝලීයකරණයේ බලපෑම, ගෝලීය ප්‍රවණතා ආදිය.

***(ලකුණු 06)***

**(b)**

**<u>ශක්තීන්</u>**

1) වෙළෙඳ නාමය පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වීම හා එයට ඇති පාරිභෝගික කැමැත්ත
2) දක්ෂ හා විශ්වාසවන්ත සේවකයින් සිටීම
3) ධනාත්මක පාරිභෝගික ප්‍රතිචාර
4) සුවිශේෂී බිස්කට් වට්ටෝරුවල හිමිකාරිත්වය

**දුර්වලතා**

1) ආනයනික අමුද්‍රව්‍ය මත යැපීම. (අමුද්‍රව්‍ය ලබා ගැනිමට නොහැකි වුවහොත් එය ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපෑ හැකිය)
2) නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම අඩු වීම
3) පවුල සතු ව්‍යාපාරයක් වීම
4) ව්‍යාපාරය භාර දීමට උරුමක්කාරයෙකු නොමැති වීම
5) වයස 80 ගණන්වල සිටින රේණුකා සහ රිචඩ් විසින් මෙහෙයවීම

**අවස්ථා**

1) එහි නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමේ හැකියාව
2) දේශීය අමුද්‍රව්‍ය ආදේශ කිරීම. එය පහසුවෙන් උප කොන්ත්‍රාත් / බාහිරට පැවරීම හරහා සිදු කළ හැක.
3) ජාත්‍යන්තර වෙළෙඳාමට ඇතුල් වීම (බිස්කට් අපනයනය)

**තර්ජන**

1) මෙම නිෂ්පාදන සඳහා භාවිත කරන ද්‍රව්‍ය ආනයනික ද්‍රව්‍ය බැවින් අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලු ඇති වීම සහ ඩොලර් අර්බුදය හේතුවෙන් ඒවා වෙළෙඳපොලේ හිඟයක් පවතී.
2) බිස්කට් පරිභෝජනය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ ආකල්ප සහ රුචිය වෙනස් වීම.
3) දේශපාලන අස්ථාවරත්වය.
4) රජයේ ප්‍රතිපත්තිවල වෙනස්කම්.
5) වත්මන් සේවකයින් ආයතනය හැර යාමේ හැකියාව.

ඉහත විශ්ලේෂණයට අනුව සංසන්දනාත්මකව බාහිර පරිසරය ව්‍යාපාරයට අඩු හිතකර බවක් පෙන්නුම් කරනු ලබයි. මේ අනුව, මෙම ව්‍යාපාරයේ ගැණුම්කරු දේශීයව නිපදවන අමුද්‍රව්‍ය හෝ වෙනත් සුදුසු විකල්පයකට ගොස් නිෂ්පාදන මිල අඩු කිරීමට සහ බිස්කට් පරිභෝජනය කෙරෙහි සාමාන්‍ය ජනතාවගේ ආකල්පය වෙනස් කරන්නේ නම් වඩා යහපත් වේ. රිචි කුකීස් ජනප්‍රිය සන්නාමයක් වන අතර සේවකයින් ඉතා දක්ෂ බැවින් අභ්‍යන්තර ශක්තීන් වාසිදායක වේ.

*(ලකුණු 06)*

## (c)

1) නිෂ්පාදනයේ ස්වභාවය
2) බෙදාහැරීමේ පරිමාව
3) බෙදාහැරීමේ දුර
4) අතරමැදියන්
5) බෙදාහැරීමේ පිරිවැය
6) වෙළෙඳපොළ රෙගුලාසි
7) තරගකාරී වාසිය

*(ලකුණු 03)*

## (d)

1) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තරඟකාරිත්වය සඳහා උපායමාර්ගික සම්පත් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඉතා වැදගත් වේ.
2) නිපුණතා හිඟතාවයන්, දුර්වල කළමනාකරණ පිළිවෙත් සහ දුර්වල ශ්‍රම බලකා පුහුණුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ඵලදායිතාව සහ නව්‍යකරණය සීමා කරයි.

aat SRI LANKA

3) ආර්ථිකය පිරිමැසුම් හා විෂය පථයේ හිඟකම

4) විශාල ව්‍යාපාර ආයතන වලට සාපේක්ෂව ඉහළ ගනුදෙනු පිරිවැය.

5) ජාල හිගකම දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ අත්දැකීම්, පළපුරුද්ද හා තොරතුරු හිඟකම යනාදී කාරණා සඳහා මෙය හේතු වේ.

6) ගෝලීයකරණය සහ ආර්ථික ඒකාබද්ධතාවය හේතුවෙන් ඇති වූ විශාල බහුජාතික ව්‍යවසායයන්ගෙන් වෙළෙඳපොළ තරගකාරිත්වය සහ සංකලනය ඉහළ යාම.

7) ප්‍රාග්ධනය නොමැතිකම.

8) බාධක සහ වෙළෙඳපොළ අසාර්ථකත්වය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට උපායමාර්ගික සම්පත් ගවේෂණය කිරීමට සහ එය තරගකාරී අවාසියක් බවට පත් වීම නිසා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ගවේෂණය කිරීමට සීමා පනවා ඇත.

*(ලකුණු 03)*

**(e)**

**1) ප්‍රතික්ෂේප කිරීම (Refuse)**

නිෂ්පාදනයක් පරිභෝජනය කිරීමෙන් පසු ඝන අපද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් ඉතිරි වන්නේ නම්, එය භාවිත නොකිරීම හෝ වෙළෙඳපොලේ ප්‍රතික්ෂේප කිරීම කළ යුතුය.

**2) අඩු කිරීම (Reduce)**

නිෂ්පාදනයේදී අපද්‍රව්‍ය අවම කිරීම එහි උපරිම මට්ටමට කිරීමට සැලසුම් කළ යුතුය. ව්‍යාපාරය අපද්‍රව්‍යවල අතුරු නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

**3) නැවත භාවිතය (Re-use)**

බෝතල්, සිලින්ඩර්, බහාලුම් වැනි භාණ්ඩ නැවත නැවත භාවිත කිරීම කළ හැකිය.

**4) ප්‍රතිචක්‍රීකරණය (Recyle)**

අපද්‍රව්‍ය වෙනත් නිෂ්පාදනයක ප්‍රධාන ද්‍රව්‍යයක් ලෙස භාවිත කළ හැකිය.

**5) ප්‍රතිස්ථාපනය කිරීම (Re-place)**

දිරාපත් නොවන ද්‍රව්‍ය වෙනුවට දිරාපත් කළ හැකි ද්‍රව්‍ය භාවිත කිරීමට ව්‍යාපාරයකට හැකිය.

**6) නැවත සිතීම (Rethink)**

ඝන අපද්‍රව්‍ය අවම කිරීම ගැන නැවත සිතීම හෝ ඒවා පරිභෝජනය කිරීමට පෙර නැවත සිතා බැලීම හෝ ඒවා කළමනාකරණය කරන්නේ කෙසේද යන්න ගැන නැවත සිතීම.

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 20)*

***C කොටසෙහි අවසානය***

aat SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*